## රජයේ නිවේදන

### 2018 අංක 35 දරන මුදල් පනත යටතේ වන නිවේදනය

2018 අංක 35 දරන මුදල් (මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද) පනතේ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු 51 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින් අංක 2147 / 72 දරන 2019 ඔක්තෝබර් 31 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග, එහි 4 වන රෙගුලාසියේ (ආ) ඡේදය පහත පරිදි ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

> "(ආ) 2019 මාර්තු මස 6 වන දින සිට 2019 ඔක්තෝම්බර් මස 31 වන දින දක්වා කාලය තුළවිවෘත කරන ලද ණයවර ලිපියක් මත ආනයන කරන ලද සිලින්ඩර් ධාරිතාව 1800 නොඉක්මවන ඕනෑම පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර ධාරිතාව 2300 නොඉක්මවන ඕනෑම ඩීසල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 නොඉක්මවන විදුලි බලයෙන් ක්‍රියා කරන ඕනෑම වාහනයක් එකී ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනයේ විස්තරය හෝ ප්‍රමාණය හෝ තාක්ෂණික පිරිවිතර හා එකී ණයවර ලිපියේ වටිනාකම හෝ කල්පිරෙන දිනය සංශෝධනය නොකිරීමට සහ 2020 මැයි මස 31 දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගනු ලැබීමට යටත්ව මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්දට යටත් නොවේ."

මහින්ද රාජපක්ෂ,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය

2020 පෙබරවාරි මස 20 වැනි දින
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.